පුවතකට සෘජුව අදාළ නොවන, කාන්තා බාහිර රූපය ඉස්මතු කොට දක්වමින් වාර්තා කිරීම ඇතැම් මාධ්‍ය තුළ දක්නට ලැබෙන භාවිතාවකි.

පේරාදෙණිය ප්‍රදේශයේ පදිංචිව සිටි පෙර පාසැල් ගුරුවරියක ඝාතනය වීමේ සිදුවීම, පුවත්පත් දෙකක් තුළ (අප්‍රේල් 16, 2023) වාර්තා වී ඇති ආකාරය, එම පසුතලය යටතේ විමසා බැලිය හැක.

එම පුවත් දෙකෙහිම අන්තර්ගතයන් තුළ අදාළ ඝාතනය වූ තැනැත්තියගේ බාහිර රූපය සම්බන්ධයෙන් සඳහන් වී තිබේ.

ඔබ සිතන ලෙසට,

1) මෙම ඝාතන සිදුවීමක් දැක්වෙන පුවතට, ඇගේ බාහිර ස්වරූපය අදාළ වන්නේ කෙසේද?

2) එසේ අදාළ නොවන්නේ නම්, "රූමතියක", "රූමත් සිරුරකට හිමිකම් කී" වැනි විශේෂණයන් ඔස්සේ එම තැනැත්තියගේ බාහිර රූපය පුවත තුළ දක්වා ඇත්තේ, මෙම සිදුවීම හැඟීම් කළඹවන සුළු (sensationalism) ආකාරයකින් පුවතට වැඩි පාඨක ආකර්ෂණයක් ලබා ගැනීමට ද?

3) එසේ නම්, එය මාධ්‍ය ආචාර ධාර්මිකව ද ගැටළුකාරී නොවන්නේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!



“රූමත්” බව පුවතට අදාළ ද?
ETHICS EYE
පෙර පාසල් ගුරුවරියගේ ඝාතකයා
ජංගම දුරකතනය ඇතුළේ?
රූමතියක වූ ඇයගේ අතගන්නට පෙම්වතෙක් සිටියේය. ඔහු ශ්‍රී ලංකා යුද හමුදාවේ සේවය කරන අම්පිටියේ පදිංචි තරුණයෙකි.
රූමතියක
2023-04-16
අරුණ
ගෙදර පෙනි පෙනී
ගෙල කපා මැරූ
ගුරුවරියගේ මරණය
තවම අබිරහසක්..!
අංජලී මරා දමා මේ වනවිට සතියකට වඩා කාලයක්ද ගෙවී ගොස්ය. රූමත් සිරුරකට හිමිකම් කී ඇගේ ඝාතනයට මේ වනවිට මුළු රටේම අවධානයද යොමුවී ඇතත් අංජලීගේ ඝාතකයා තවමත් නිදැල්ලේය.
රූමත් සිරුරකට හිමිකම් කී
2023-04-16
ඉරිදා මව්බිම